**කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025.06.19 වන දින පැවති ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව**

සහභාගී වූ ගරු සභික මහත්ම/ මහත්මීන්

| තනතුර | නම |
|---|---|
| 01.ගරු සභාපති | - සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා |
| 02. ගරු සභික | - H.M.කිත්සිරි හේරත් මහතා |
| 03. ගරු සභික | - S.ජෙගදීසන් මහතා |
| 04. ගරු සභික | - R.M.සුනේත්‍රා කුමාරි මිය |
| 05. ගරු සභික | - P.G.සන්ත දිසානායක මහතා |
| 06. ගරු සභික | - I.T.M.C.C.B.පොතුහැර මහතා |
| 07. ගරු සභික | - S.රෙජිනෝල්ඩ් මහතා |
| 08. ගරු සභික | - M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා |
| 09. සමාජ ක්‍රියාකාරී | - M.H.ෆරුකාන් මහතා |
| 10. බාහිර පාර්ශව | - ස්වර්ණා කුමාරි දසානායක මහත්මිය |

2025 ක් වූ ජූනි මස 19 වන දින පෙ.ව. 10.00 ට කැකිරාව ප්‍රාදේශීය සභාවේ කාර්මික සේවා කමිටු රැස්වීම ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතාගේ ප්‍රධානත්වයෙන් කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී ආරම්භ විය.

2025 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රජා සංවර්ධන සැලැස්ම හා එහි වැඩසටහන් සම්බන්ධව විෂය නිලධාරිනිය විසින් හඳුන්වා දෙන ලද අතර, 2025 ජනවාරි මස සිට ජූනි මස දක්වා සිදු කරන ලද වැඩසටහන් හා එහි ප්‍රගතිය පිළිබඳව ද දැනුවත් කරන ලදී. එමෙන්ම ජූලි මාසය තුල ක්‍රියාත්මක කිරිමට යෝජිත වැඩසටහන් සඳහා අනුමැතියට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව

01.බල ප්‍රෙද්ශය තුල පවතින පෙර පාසල් ගුරුවරුන් සඳහා අප ද්‍රව්‍ය කලමනාකරණය කිරිම සම්බන්ධ දැනුවත් කිරිමේ වැඩසටහනක් පැවැත්වීම

02. කැකිරාව මහජන පුස්තකාලයේ පාඨක සමාජය විසින් දිනන මුතු නමින් ත්‍රෛමාසික සඟරාවක් එළි දැක්වීමට කටයුතු කිරිම

03.බල ප්‍රදේශය තුල තෝරා ගත් පාසල් කීපයක් සම්බන්ධ කර ගනිමින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පැවැත්වීම

04.මහජන පුස්තකාල කාර්යය මණ්ඩලය සඳහා පොත් බැඳිමේ පුහුණු වැඩසටහනක් පැවැත්වීම

05.කැකිරාව ආයුර්වේදය මඟින් වාර්ෂිකව කාර්තුවලට අදාලව ජංගම සායන වැඩසටහනක් පැවැත්වීම

**ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා** මෙම වැඩසටහන් ඉතා හොඳ වැඩසටහන් වන බැවින් ,පෙර පාසල් ගුරුවරුන් සඳහා හොඳ සම්පත්දායෙකු සම්බන්ධ කර ගනිමින් රසවින්දනාත්මක හා ආකල්ප සංවර්ධනය කිරිම සඳහා ද එම වැඩසටහන සිදු කල යුතු බවත්, පුස්තකාලය විසින් සිදු කිරිමට සැලසුම් කර ඇති ත්‍රෛමාසික සඟරාව සඳහා ද බාහිර පාර්ශවයන්ද සම්බන්ද කර ගනිමින් ඒ සඳහා සැලැස්මක් සකස් කර ඉදිරියේ දි සාකච්ඡා කර කටයුතු කිරිම සුදුසු බවට පවසා සිටින ලදී. **ගරු සභික M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා** මහජන පුස්තකාල මඟින් දුශ්කර ප්‍රදේශවල ජනතාව සඳහා ද පුසතකාල සේවාව ලබා ගැනිමට අවස්ථාව සලසා දීමට කටයුතු කිරිම සුදුසු බව පවසා සිටින ලදී. **ගරු සභික I.T.M.C.C.B.පොතුහැර මහතා** එය හොඳ අදහසක් වන නමුත්,ආයතනය තුල වාහන ලබා ගැනීමේ දී අපහසුතා පවතින බැවින් ,තෝරාගත් පොදු ස්ථානයක් තුල එම කාර්යය සිදු කිරිමට හැකියාව තිබෙනවානම් එය ක්‍රියාත්මක කිරිමට කටයුතු කිරිම ඉතා සුදුසු බවයි. **ගරු සභික P.G.සන්ත දිසානායක මහතා** ආදායම් උත්පාදන වැඩසටහනක් ලෙස කාන්තාවන් සඳහා ස්වයං රැකියා වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට කටයුතු කිරිම සුදුසු බවත් පවසා සිටින ලදී.

**කමිටු තීරණ 2025/01**
**ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා**

01.බල ප්‍රෙද්ශය තුල පවතින පෙර පාසල් ගුරුවරුන් සඳහා අප ද්‍රව්‍ය කලමනාකරණය කිරීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම

02. කැකිරාව මහජන පුස්තකාලෙය් පාඨක සමාජය විසින් දිනන මුතු නමින් ත්‍රෛමාසික සඟරාවක් එළි දැක්වීමට කටයුතු කිරීම

03.බල ප්‍රදේශය තුල තෝරා ගත් පාසල් කීපයක් සම්බන්ධ කර ගනිමින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පැවැත්වීම

04.මහජන පුස්තකාල කාර්යය මණ්ඩලය සඳහා පොත් බැඳීමේ පුහුණු වැඩසටහනක් පැවැත්වීම

05.කැකිරාව ආයුර්වේදය මඟින් වාර්ෂිකව කාර්තුවලට අදාලව ජංගම සායන වැඩසටහනක් පැවැත්වීම

2025 වර්ෂය තුල ඉදිරි කාල සීමාව තුල ඉදිරිපත් කර ඇති මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**ගරු සභික S.ජෙගදීසන් මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව අවශ්‍යතාවය මත ප්‍රමුඛතාවය අනුව සම්පත්දායකයින් ද සම්බන්ධ කර ගැනීමින් ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට නිර්දේශ කරන ලදී.

ඒ අනුව මෙදිනට සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොමැති බැවින්, කමිටුවේ කටයුතු ප.ව.12.45 ට පමණ නිමා කරන ලදී.

2025.06.19 දින
ප්‍රාදේශිය සභාව,
කැකිරාව.

කමිටු සභාපති,
ප්‍රාදේශිය සභාව,
කැකිරාව.

| | | |
|---|---|---|
| 01.ගරු සභාපති | - සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා | ....................................... |
| 02. ගරු උප සභාපති | - H.M.කිත්සිරි හේරත් මහතා | ....................................... |
| 03. ගරු සභික | - S.ජෙගදීසන් මහතා | ....................................... |
| 04. ගරු සභික | - R.M.සුනේත්‍රා කුමාරි මිය | ....................................... |
| 05. ගරු සභික | - P.G.සන්ත දිසානායක මහතා | ....................................... |
| 06. ගරු සභික | - I.T.M.C.C.B.පොතුහැර මහතා | ....................................... |
| 07. ගරු සභික | - S.රෙජිනෝල්ඩ් මහතා | ....................................... |
| 08. ගරු සභික | - M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා | ....................................... |
| 09. සමාජ ක්‍රියාකාරී | - M.H.ෆරුකාන් මහතා | ....................................... |
| 10. බාහිර පාර්ශව | - ස්වර්ණා කුමාරි දසානායක මහත්මිය | ....................................... |